# බළන්ගොඩ නගර සභාව

## 2022-06-24 වන දිනැති විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2022.06.24**

**වේලාව - පෙ.ව. 10.30**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති වසන්ත ගුණරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින විශේෂ මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | වසන්ත ගුණරත්න මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රි | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රි | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රි | කේ. ජී. පේමදාස මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රිනී | මංගලිකා ඉලංකෝන් මැතිතුමිය |
| 7. ගරු නාගරික මන්ත්‍රිනී | සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය |
| 8. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |

**නිලධාරි සහභාගීත්වය**

1. ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී ජී.ඩී.ඒ.සේමපාල මිය

ගරු සභාපතිතුමන් විසින් මෙදින විශේෂ මහ සභාව සඳහා සහභාගි වූ ගරු නාගරික මන්ත්‍රීවරුන් ඇතුළු සියළුම දෙනා පිළිගනිමින් ගරු සභාවේ වැඩකටයුතු ආරම්භ කරන ලදි. අංක 17 දරණ කුකුල් මස් කඩ කාමරය සඳහා කැඳවන ලද ටෙන්ඩර්පත් විවෘත කිරීම හා සුදුසු බදුකරුවන් තෝරා ගැනීම වෙනුවෙන් මෙදින විශේෂ මහ සභාව පවත්වන බැවින් ඒ සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත්කරන ලදි.

ටෙන්ඩර් පත් විවෘත කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත්කර ගන්නා ලදි.

ටෙන්ඩර් මණ්ඩලය විසින් අනුමත කරන ලද පහත සඳහන් තීරණ සියල්ල ගරු සභාපතිතුමන් විසින් නැවත වරක් ගරු සභාවට ඉදිරිපත් කරන ලදි.

- අංක 17 දරණ කුකුල් මස් කඩ කාමරය සඳහා ටෙන්ඩර් පත් එකක් නිකුත්කර තිබූ අතර, එම ලංසුපත ලැබී තිබුණි. එහිදී ලංසු මුදල වශයෙන් ජමල්දීන් මොහොමඩ් ඉලයාස් මහතා විසින් ඉදිරිපත් කර තිබූ රු. 33,000.00 ක මාසික ලංසු මුදල පිළිගැනීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදි.

ටෙන්ඩර් මණ්ඩලය විසින් අනුමත කරන ලද ඉහතින් ලබාගන්නා තීරණය ගරු සභාපතිතුමන් විසින් නැවත සභාවට ඉදිරිපත් කරමින් ගරු සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදුව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

අද දින ගරු සභාව සාර්ථකව පවත්වා ගැනීමට සහයෝගය ලබාදුන් ගරු නාගරික මන්ත්‍රී මණ්ඩලය හා කාර්ය මණ්ඩලය සඳහා ස්තුතිය පුදකරමින් පෙ.ව 10.50 ට පමණ විශේෂ මහ සභාවේ කටයුතු අවසන් කරන ලදි.

ඩබ්.ඒ.වසන්ත ගුණරත්න,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.